යම් කිසි බරපතල සමාජ ගැටළුවක් පවා ඒ අයුරින්ම වාර්තා කිරීමත්, එම සමාජ ගැටළුවේ යථා ස්වභාවය සම්බන්ධයෙන් සමාජය දැනුවත් කිරීමත්, මාධ්‍ය අත ඇති වගකීමක් ලෙසින් ගත හැක. කෙසේ නමුත්, එවැනි සමාජ ගැටළුවකට අදාළ සිදුවීමක් වාර්තා කිරීමේදී මාධ්‍ය ප්‍රවේසම් විය යුතු එක් කාරණයක් වන්නේ, එය භාවාතිෂය කතාන්තරයක් බවට පත් නොකිරීමටයි. මන්දයත්, ඒ ඔස්සේ එම සිදුවීම හා බැඳි සමාජ ගැටළුව සහ පාඨකයාට ග්‍රහණය විය යුතු සියුම් තොරතුරු ඒ ඔස්සේ යටපත්ව යෑමේ ඉඩක් පැවතීමයි.
ඊට උදාහරණයක් ලෙසින් මෙම දිවයින ඉරිදා සංග්‍රහයේ (06/13) "අම්මා ලක්ෂ 21, දුව ලක්ෂ 03යි. ඔන්ලයින් මිනිස් ජාවාරමේ ඩන්ස්ටන් මාට්ටු" යන මැයෙන් යුතු ලිපිය දැක්විය හැක.
මෙවැනි සිදුවීමක් වාර්තා කිරීමේදී, භාවාතිෂය නොවීම, පාඨකයාට එය ප්‍රවෘත්තියක් ලෙසින් ගෙන, එම සමාජ ගැටළුව සම්බන්ධයෙන් සමබර විනිශ්චයකට පැමිණීමේ ඉඩ යටපත් වීමට නොදීම මනා ආචාර ධාර්මික මාධ්‍යකරණයයි.
#MediaEthicsSL #lka #SinhalaNews #SundayDivaina